# 9 වන පරිච්ඡේදය

# කෘෂිකාර්මික රටක ආර්ථිකය කාර්මික රටක ආර්ථිකය හා සැසඳීම

ස්වාභාවික සම්පත් පරිහරණය මගින් දළ දේශීය නිෂ්පාදනයට සහ, ජාතික නිෂ්පාදනයට ලැබෙන දායකත්වය, සේවා නියුක්තිය, අපනයන වෙළෙඳාමට ඇති දායකත්වය සහ තාක්ෂණය වැනි සාධක පදනම් කර ගෙන ලෝකයේ රටවල් කෘෂිකාර්මික අර්ථක්‍රමයක් හා කාර්මික අර්ථක්‍රමයක් ඇති රටවල් ලෙස වර්ග කළ හැකි ය. ඒ අනුව කාර්මික හා කෘෂිකාර්මික රටවල් හඳුනාගත හැකි ලක්ෂණ ගණනාවක් ඇත. ඒවා 9.1 වගුවේ දැක්වේ.

9.1 වගුව

කෘෂිකාර්මික හා කාර්මික රටවල් හඳුනා ගත හැකි ලක්ෂණ

| කෘෂිකාර්මික රටක ආර්ථිකයේ ලක්ෂණ | කාර්මික රටක ආරථිකයේ ලක්ෂණ |
|---|---|
| ❒ දළ දේශීය නිෂ්පාදිතයට කෘෂිකාර්මික අංශයේ දායකත්වය වැඩි ය. | ❒ දළ දේශීය නිෂ්පාදනයට කාර්මික අංශයේ දායකත්වය වැඩි ය. |
| ❒ ඒක ශීර්ෂ දළ ජාතික නිෂ්පාදිතය පහළ අගයක් ගනී. | ❒ ඒක ශීර්ෂ දළ ජාතික නිෂ්පාදිතය ඉහළ අගයක් ගනී. |
| ❒ ප්‍රාග්ධන සම්පත් හිග ය. | ❒ ප්‍රාග්ධන සම්පත් ප්‍රමාණය ඉහළ ය. |
| ❒ තාක්ෂණික දැනුම පහළ මට්ටමක පවතී. | ❒ තාක්ෂණික දැනුම ඉහළ මට්ටමක පවතී. |
| ❒ ජන සංඛ්‍යා වර්ධන වේගය වැඩි ය. | ❒ ජන සංඛ්‍යා වර්ධන වේගය අඩු ය. |
| ❒ ග්‍රාමීය ජන සංඛ්‍යාව වැඩි ය. | ❒ නාගරික ජන සංඛ්‍යාව වැඩි ය. |
| ❒ වෙළෙඳපොළ සීමා සහිත ය. | ❒ වෙළෙඳපොළ පුළුල් ය. |
| ❒ අධ්‍යාපනය පහළ මට්ටමක ඇත. | ❒ අධ්‍යාපන මට්ටම ඉහළ ය. |
| ❒ ඉතිරිකිරීම් හා ආයෝජන පහළ මට්ටමක පවතී. | ❒ ඉතිරිකිරීම් හා ආයෝජන ඉහළ මට්ටමක පවතී. |

ඒ අනුව, ඇමරිකා එක්සත්ජනපදය, කැනඩාව, ජර්මනිය, ප්‍රංශය, ඕස්ට්‍රේලියාව, ස්වීඩනය, නොර්වේ, ජපානය වැනි රටවල් කාර්මික අර්ථ ක්‍රමයක් ඇති රටවලට ද ඉන්දියාව, නේපාලය, ශ්‍රී ලංකාව, මියන්මාරය, භූතානය, ඇෆ්ගනිස්තානය ආදී රටවල් කෘෂිකාර්මික අර්ථ ක්‍රමයක් ඇති රටවලට ද නිදසුන් ලෙස දැක්විය හැකි ය.

කෘෂිකාර්මික හා කාර්මික අර්ථක්‍රමයෙහි දක්නට ඇති ඉහත කී වෙනස්කම් එවැනි රටවල් දෙකක් සසඳා බැලීමෙන් හොඳින් අවබෝධ කර ගත හැකිවේ. ඊට නිදසුන් දෙකක් මෙහි දක්වා ඇත.

ක්‍රියාකාරකම 1



- ලෝක ආකෘති සිතියමක කාර්මික රටවල් පහක් හා කෘෂිකාර්මික රටවල් පහක් ලකුණු කර නම් කරන්න.
- කෘෂිකාර්මික අර්ථක්‍රමයක් සහිත රටක දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණ පහක් ලියන්න.

## ආර්ජන්ටිනාව (කෘෂිකාර්මික රටක්) සමග ජර්මනිය (කාර්මික රටක්) සසඳා බැලීම

පහත සඳහන් නිර්ණායකයන් යටතේ මෙම රටවල් දෙක සසඳා බලා ඇත.

- ❒ සම්පත් පදනම
- ❒ දළ දේශීය නිෂ්පාදිතයට දායකත්වය
- ❒ සේවා නියුක්ති ප්‍රතිශතය
- ❒ අපනයන වෙළෙඳාමට දායකත්වය
- ❒ තාක්ෂණය
- ❒ ගැටලු හා විභවතා

9.2 වගුව

| නිර්ණායකයන් | ආර්ජන්ටිනාව (කෘෂිකාර්මික) | ජර්මනිය (කාර්මික) |
|---|---|---|
| ❒ සම්පත් හා නිෂ්පාදන | <br><br>පෙට්‍රල්, ස්වාභාවික වායුව, යකඩ, රන්රිදී, ඊයම්, ටින්, ටින්ස්ටන්, ස්වාභාවික ගෑස්, ඛනිජ තෙල් වැනි සම්පත් ඇත.<br>මුළු භූමියෙන් 52%ක් පමණ සෞම්‍ය කලාපීය තණ බිමිය. (පැම්පාස් තෘණ භූමිය)<br>පැරානා පැරගුවේ, උරුගුවේ ගංගා නිම්න ආශ්‍රිත ව සාරවත් පසක් ඇත.<br>බිව්, සීනි, අල, බාර්ලි, කිරි ආදිය ප්‍රධාන නිෂ්පාදන වේ. | <br><br>ගල්අඟුරු, පෙට්‍රෝලියම්, යකඩ, නිකල් ස්වාභාවික වායු<br><br>කර්මාන්ත<br>යකඩ හා වානේ, ගල්අඟුරු, සිමෙන්ති, රසායන ද්‍රව්‍ය, යන්ත්‍ර සූත්‍ර, වාහන, යන්ත්‍රෝපකරණ, විදුලි උපකරණ, ආහාර, බීම වර්ග, නැව් කර්මාන්තය, රෙදිපිළි නිෂ්පාදනය |
| ❒ දළ දේශීය නිෂ්පාදිතය (ස්ථාවර මිල අනුව) | ඇ.ඩො.බි. 709.7 (2011)<br>(purchasing power parity) | ඇ.ඩො. ට්‍රි 3.085 (2011) |
| ❒ දළ දේශීය නිෂ්පාදනය ඒක පුද්ගල | ඇ.ඩො. 17,400 (2011) | ඇ.ඩො. 37.900 (2011) |
| ❒ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය | 8% (2011) | 2.7% (2011) |
| ❒ දළ දේශීය නිෂ්පාදිතයට දායකත්වය | කෘෂි අංශය 10%<br>කාර්මික අංශය 30.7%<br>සේවා අංශය 59.2% (2011) | කෘෂි අංශය 0.8%<br>කාර්මික අංශය 28.1%<br>සේවා අංශය 71% (2011) |
| ❒ සේවා නියුක්තිය | කෘෂි අංශය 5.0%<br>කාර්මික අංශය 23.0%<br>සේවා අංශය 72.0% (2009) | කෘෂි අංශය 2.4%<br>කාර්මික අංශය 29.7%<br>සේවා අංශය 67.8% (2005) |

| නිර්ණායකයන් | ආර්ජන්ටිනාව (කෘෂිකාර්මික) | ජර්මනිය (කාර්මික) |
|---|---|---|
| ❑ අපනයන වෙළෙඳාම | කෘෂිකාර්මික නිෂ්පාදන අපනයනයට ප්‍රමුඛත්වයක් ලැබීම. සෝයා නිෂ්පාදන - තිරිඟු පලතුරු ප්‍රධාන වේ. කෘෂිකර්මයට නවීන තාක්ෂණය යොදා ගැනේ. සුළු වශයෙන් මෝටර් රථ ද අපනයනය කෙරේ. | යන්ත්‍ර සූත්‍ර, රෙදිපිළි, රසායන නිෂ්පාදන පරිගණක අපනයනය ප්‍රමුඛත්වයක් ගනී. |
| ❑ අපනයන වෙළෙඳාමේ ප්‍රධාන හවුල්කරුවෝ | බ්‍රසීලය 21.2%<br>චීනය 9.1%<br>ඇ.එ.ජ. 5.4%<br>චිලි 7.0%<br>(2010) | ප්‍රංශය 10.1%<br>ඇ.එ.ජ. 6.7%<br>නෙදර්ලන්තය 6.6%<br>එ.රාජධානිය 6.6%<br>ඉතාලිය 6.3%<br>ඔස්ට්‍රියාව 5.7%<br>බෙල්ජියම 5.2%<br>චීනය 4.7%<br>ස්විස්ටර්ලන්තය 4.5% (2010) |
| ❑ තාක්ෂණය | ♦ නව තාක්ෂණය සංවර්ධන කාර්යයන්ට යොදා ගැනීම වේගවත් වී ඇත.<br>♦ ඒ නිසා දළ දේශීය නිෂ්පාදනයේ වර්ධන වේගය 2011 දී 8% විය. | ♦ නව තාක්ෂණික ඥානය ඉහළ මට්ටමක පවතී.<br>♦ න්‍යෂ්ටික බලය ද භාවිත කෙරේ. නැව්, ගුවන් යානා නිපදවීම උසස් තත්ත්වයක පවතී. |
| ❑ ගැටලු හා විභවතා | ♦ ජන සංඛ්‍යා වර්ධන වේගය 2010දී 1.04%ක් වීම නිසා සම්පත් බෙදී යාම කෙරෙහි බලපෑමක් ඇති වේ.<br>♦ අධ්‍යාපනික අංශය දියුණු කිරීමෙන් මානව සම්පත් සංවර්ධනය වේගවත් කොට රටේ සංවර්ධනය වේගවත් කිරීමට ඉඩ ප්‍රස්තාව ඇත.<br>♦ ඛනිජ අමුද්‍රව්‍ය ලෙසට අපනයනය කෙරේ. | ♦ දිගු කලක් පරිහරණය කිරීම නිසා ගල්අඟුරු පෙට්‍රෝලියම් වැනි ඉන්ධන සම්පත් හිඟ වීමක් පෙන්වයි.<br>♦ න්‍යෂ්ටික බල උත්පාදනය කෙරෙහි විශාල බලාපොරොත්තු තබා ඇත.<br>♦ ලෝකයේ දියුණු කාර්මික රටක් වශයෙන් තව දුරටත් නැගී සිටීමට කටයුතු කරයි.<br>♦ ගල්අඟුරු, පෙට්‍රෝලියම් ආනයනය කරයි. |


දත්ත මූලාශ්‍රය:https://www.cia.gov/library/publications/TheWorldFactBook-2011 මැයි 26, http://www.indexmundi.com/argentina/population_growth_rate.html

**ක්‍රියාකාරකම 2**

- ♦ කාර්මික අර්ථක්‍රමයක් ඇති රටක් හඳුනා ගැනීමට යොදා ගන්නා නිර්ණායකයන් කෙටියෙන් පැහැදිලි කරන්න.



9.1 රූපය
ආර්ජන්ටිනාවේ තිරිඟු වගා බිමක්



9.2 රූපය
ජර්මනියේ මෝටර් රථ කම්හලක්

ඉන්දියාව (කෘෂිකාර්මික) හා ජපානය (කාර්මික) රටවල් සැසඳීම.

9.3 වගුව

| නිර්ණායකයන් | ඉන්දියාව | ජපානය |
|---|---|---|
| ❐ සම්පත් හා නිෂ්පාදන | ගල්අඟුරු, යපස්, මැංගනීස්, මයිකා, ටයිටේනියම්, ස්වාභාවික ගෑස්, දියමන්ති, පැට්‍රෝලියම්, හුණුගල්, තෝරියම්, තෙල් වැනි සම්පත් ඇත.<br><br>රෙදිපිළි, රසායන ද්‍රව්‍යය, ආහාර සැකසීම, මෝටර් රථ, වානේ, ගමනාගමන උපකරණ, සිමෙන්ති, ආකර, ඛනිජතෙල්, යන්ත්‍ර සූත්‍ර, මෘදුකාංග ප්‍රධාන කාර්මික නිෂ්පාදනයන් ය.<br><br>වී, තිරිඟු, තෙල් ලබා ගන්නා ඇට වර්ග, කපු, ජුට්, තේ, උක්, අල, හරක්, බැටළු, මාළු ප්‍රධාන නිෂ්පාදන වේ.<br>ඉන්දියාවේ මුළු බිම් ප්‍රමාණයෙන් 57%ක් කෘෂිකර්මය සඳහා යොදා ගනී. | තෙල් සම්පත් ඇත.<br><br>මෝටර් රථ, රසායන ද්‍රව්‍ය, නැව් කර්මාන්තය, කාර්යාලයීය යන්ත්‍රෝපකරණ, අර්ධ නිමි භාණ්ඩ, සැකසූ ආහාර, කාර්මික නිෂ්පාදන අතර ප්‍රධාන වේ.<br><br>වී, තිරිඟු, බීට් සීනි, එළවළු, පලතුරු ඌරු මස්, කිරි ආහාර, බිත්තර, මාළු ප්‍රධාන නිෂ්පාදන වේ. |
| ❐ දළ දේශීය නිෂ්පාදිතය | ඇ.ඩො.ට්‍රි 4.463 (2011) | ඇ.ඩො.ට්‍රි 4.389 (2011) |
| ❐ ඒකපුද්ගල දළ දේශීය නිෂ්පාදිතය | ඇ.ඩො. 3 700 (2011) | ඇ.ඩො. 34 300 (2011) |
| ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය | 7.8% (2011) | -0. 5% (2011) |
| දළ දේශීය නිෂ්පාදිතයට දායකත්වය | කෘෂි අංශය 18.1%<br>කාර්මික අංශය 26.3%<br>සේවා අංශය 55.6%<br>(2011) | කෘෂි අංශය 1.4%<br>කාර්මික අංශය 24.0%<br>සේවා අංශය 74.6%<br>(2011) |
| ❐ සේවා නියුක්තිය | කෘෂි අංශය 52.0%<br>කාර්මික අංශය 14.0%<br>සේවා අංශය 34.0%<br>(2009) | කෘෂි අංශය 3.9%<br>කාර්මික අංශය 26.2%<br>සේවා අංශය 69.8%<br>(2010) |
| ❐ අපනයන වෙළෙඳාම | මුළු වටිනාකම,<br>ඇ.එ.ජ. ඩොලර් බිලියන 298.2 (2011) | මුළු වටිනාකම,<br>ඇ.එ.ජ. ඩොලර් බිලියන 800.8 (2011) |
| ❐ අපනයන වෙළෙඳාමේ ප්‍රධාන හවුල්කරුවෝ | ඇ.එ.ජ. 12.6%<br>එක්සත් අරාබි එමිරේට්ස් 12.2%<br>චීනය 8.1%<br>හොංකොං 4.1%<br>(2010) | චීනය 19.4%<br>ඇ.එ.ජ. 15.7%<br>දකුණු කොරියාව 8.1%<br>හොංකොං 5.5%<br>තායිලන්තය 4.4% (2010) |
| ❐ තාක්ෂණය | ♦ නවීන තාක්ෂණ ඥානය ලබා ගැනීමට උපරිම උත්සාහයක් දරමින් සිටියි.<br>♦ පරිගණක මෘදුකාංග නිපදවීම අතින් ලෝකයේ ප්‍රමුඛස්ථානයක් හිමි කර ගනී. | ♦ නවීන තාක්ෂණය දියුණු මට්ටමක ඇත.<br>♦ රොබෝවරුන්ගේ ආධාර උපකාරයන් නිෂ්පාදන කර්මාන්තයට යොදා ගෙන ඇත.<br>♦ සියලු කාර්මික අමුද්‍රව්‍ය සහ බලශක්ති මූලයන් ආනයනය කර භාණ්ඩ නිපදවීම සිදු කෙරේ. |

| නිර්ණායකයන් | ඉන්දියාව | ජපානය |
|---|---|---|
| ❒ ගැටලු සහ විභවතා | ♦ ජන සංඛ්‍යාව අධික ය. ජන සංඛ්‍යා වර්ධන වේගය වැඩි වේ.<br>2012 මුළු ජනසංඛ්‍යාව මිලියන 1205<br>ජන සංඛ්‍යා වර්ධන වේගය 1.31% (2012)<br><br>♦ ඒ නිසා වැඩි වන ජනතාවගේ අවශ්‍යතා සපුරාලීමට රජයට දැඩි වෙහෙසක් කිරීමට සිදු ව ඇත.<br><br>♦ පස් අවුරුදු සැලසුම් මඟින් එම ගැටලුවලට විසඳුම් සෙවීමට උත්සාහ දරයි.<br><br>♦ කෘෂිකාර්මික අංශයේ දියුණුවට සමගාමී ව කාර්මික අංශයේ දියුණුව ඇති කරමින් ඉහළ ආරථිකයක් ඇති රටක් ලෙස නැගී සිටීම ප්‍රධාන අරමුණ යි. | ♦ ජපානයේ මෝටර් රථ වෙළෙඳපොළට වෙනත් රටවල් සමග තරග කිරීමට සිදු වී ඇත. ඒ නිසා විදේශ වෙළෙඳපොළ හොඳ මට්ටමක පවත්වා ගැනීමට දැඩි වෙහෙසක් දැරිය යුතුයි.<br><br>♦ තායිවානය, ද. කොරියාව වැනි රටවලින් එල්ල වන තර්ජනයට මුහුණදීමට සුවිශේෂ නිෂ්පාදන එළි දැක්වීමට ප්‍රයත්න දරයි.<br><br>♦ ආනයනික සම්පත් මත යැපීමට සිදු වී ඇත. නමුත් ආනයනික සම්පත් සඳහා වැය කළ යුතු මුදල අධික යි. මේ නිසා නිෂ්පාදන පිරිවැය ඉහළ යාමෙන් ආර්ථික දුෂ්කරතා හට ගනී.<br><br>♦ ජපානය මුහුණ දෙන තවත් ගැටලුවක් වී ඇත්තේ පරිසර දූෂණය යි. |

දත්ත මූලාශ්‍රය : https://www.cia.gov/library/publications/ TheWorld Fact Book/ geos/bg.html 2012.03.15,
http://www.indexmundi.com/india/population_growth_rate.html

ක්‍රියාකාරකම 3

- ♦ කාර්මික ආර්ථිකයක් ඇති රටක් ලෙස හඳුනා ගැනීමට මූලික වශයෙන් යොදා ගන්නා නිර්ණායකයන් පැහැදිලි කරන්න.
- ♦ සිතියම් පොතක් ඇසුරින් පහත සඳහන් රටවල දී ඇති තොරතුරු ඇඳ දක්වන්න.

ඉන්දියාවේ - භූමි පරිභෝගය
ජපන් දූපත්වල - කාර්මික ප්‍රදේශ
ජර්මනියේ - කාර්මික ප්‍රදේශ
ආර්ජන්ටිනාවේ - භූමි පරිභෝගය



9.3 රූපය
ජපානයේ මෝටර් රථ කම්හලක්



9.4 රූපය
ඉන්දියාවේ කපු වගා බිමක්